**හෝමියෝපති වෛද්‍ය සභාව - 2015**

**-------------------------------------------**

හෝමියෝපති වෛද්‍ය සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI -1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

**---------------**

## 2.1 මතය

**-------**

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට හෝමියෝපති වෛද්‍ය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ

ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගෙන තිබුණු පිරිවැය රු.42,475 ක් වූ වෛද්‍ය උපකරණ 5 ක් ප්‍රාග්ධනිත කිරීම වෙනුවට පුනරාවර්තන වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) හෝමියෝපති වෛද්‍ය සභාවේ සේවයේ නියුතු 18 දෙනෙකුගෙන් යුත් ස්ථිර කාර්ය මණ්ඩලය වෙනුවෙන් පාරිතෝෂික ප්‍රතිපාදන සලසා නොතිබුණි.

### 2.2.2 නීතී රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීතී රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 395 | ජංගම ගිණුම් දෙක වෙනුවෙන් බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 756 (1) | සෑම වර්ෂයකම දෙසැම්බර් 15 හෝ එකී දිනට ආසන්නව සමීක්ෂණ මණ්ඩලයක් පත්කර භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කළ යුතු වුවද 2015 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය 2016 ජූලි 31 වන විටත් සිදු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.271,598 ක අතිරික්තයක් වූ අතර එයට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.170,636 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.442,234 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂය සඳහා රජයේ පුනරාවර්තන ප්‍රතිපාදන රු.5,798,043 කින් වැඩිවීම ඉහත වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.74,938 ක අතිරික්තයක් වූ අතර 2012, 2013 හා 2014 වර්ෂවල මූල්‍ය ප්‍රතිඵල පිළිවෙලින් රු.29,305 ක, රු.111,977 ක හා රු.170,636 ක ඌනතාවයන් විය. 2015 වර්ෂයේදී එය රු.271,598 ක අතිරික්තයක් වී තිබුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සැළකිල්ලට ගැනීමේදී 2011 වර්ෂයේදී රු.4,544,910 ක්වූ දායකත්වය 2015 වර්ෂයේදී රු.9,951,274 ක් දක්වා සියයට 2 සිට සියයට 111 අතර උච්චාවචනයක් සහිතව වර්ධනයවී තිබුණි.

## 3.2 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

---

වෛද්‍ය සභාවේ සේවය කළ කම්කරුවෙකු සේවයෙන් ඉවත් කිරීමට එරෙහිව රු.3,000,000 ක වන්දි ඉල්ලා එක් නඩුවක් සහ තාවකාලික වෛද්‍යවරුන්ගේ ලියාපදිංචිය අහෝසි කිරීම, ඔවුන්ගේ විභාග පැවැත්වීමට ඉඩ නොදීම හා අතුරු පාලක කමිටුව අහෝසි කිරීම යනාදී කරුණු මුල් කරගෙන අදාළ පාර්ශවයන් විසින් නඩු 05 ක් අධිකරණවල ගොනු කර තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---

### 4.1 කාර්යසාධනය

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

1970 අංක 7 දරන හෝමියෝපති පනත ප්‍රකාරව

- හෝමියෝපති ක්‍රමයට අනුව වෛද්‍යකර්මයෙහි යෙදීම ක්‍රමවත් කිරීම, පාලනය කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ ධෛර්යමත් කිරීම.
- හෝමියෝපති වෛද්‍ය විද්‍යාව හැදෑරීම සහ ඒ පිළිබඳ පර්යේෂණ කිරීම ධෛර්යමත් කිරීම, හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් පිහිටුවීම හා එය නඩත්තු කර ගෙන යාම.
- හෝමියෝපති වෛද්‍ය ක්‍රමයට අනුව රෝග පිළිබඳ අන්වේශණයට සහ මහජන සෞඛ්‍ය වර්ධනයට පියවර ගැනීම සංවර්ධනය කිරීම හෝ එය ධෛර්යමත් කිරීම.
- හෝමියෝපති ආයතන ක්‍රමවත් කිරීම හා පාලනය කිරීම සහ හෝමියෝපති ඖෂධ වර්ග, බෙහෙත් සහ වෙනත් ඖෂධ සංයෝග නිෂ්පාදනය, ආනයනය, විකිණීම සහ බෙදාහැරීම ක්‍රමවත් කිරීම හා පාලනය කිරීම සභාවේ අරමුණු ලෙස දක්වා තිබුණි.

සමාලෝචිත වර්ෂය තුලදී ඉහත අරමුණු ඉටුකර ගැනීම පිළිබඳව සිදු කරන ලද පරික්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ඉහත අරමුණු වලින් හෝමියෝපති ක්‍රමවේදයට අනුව වෛද්‍ය කර්මයෙහි යෙදීම ක්‍රමවත් කිරීම, ප්‍රවර්ධනය කිරීම හා ධෛර්යමත් කිරීම, හෝමියෝපති වෛද්‍ය විද්‍යාව හැදෑරීම සහ ඒ පිළිබඳ පර්යේෂණ කිරීම ධෛර්යමත් කිරීම යන ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කර නොතිබුණු අවස්ථා පහත පරිදි විය.

(i) ජංගම සායන 21 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද, ඉන් සායන 14 ක් ම පවත්වා නොතිබුණි.

(ii) හෝමියෝපති වෛද්‍ය ක්‍රමය දැනුවත් කිරීමේ පාසැල් වැඩසටහන් 03 ක් පැවැත්වීම, සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහ සියලුම ආයතනවල නිලධාරීන් දැනුවත් කිරීම සඳහා සම්මන්ත්‍රණ පැවැත්වීම, හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳ ප්‍රචාරයක් ලබාදීම සඳහා රූපවාහිනී හා ගුවන් විදුලි සාකච්ඡා 05 ක් සංවිධානය කිරීම Web Home Page එකක් ආරම්භ කිරීම යන සැලසුම් ක්‍රියාත්මක කර නොතිබුණි.

(iii) හෝමියෝපති වෛද්‍යවරුන්ගේ සේවය සහ අත්දැකීම් ඇගයීමේ වැඩමුළු 02 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද ඉන් එක් වැඩමුළුවක් පමණක් පවත්වා තිබුණි.

(iv) හෝමියෝපති වෛද්‍ය සභාව සඳහා පිළිගත් නිශ්චිත පරිපාලන පරිපාටියක් හඳුන්වාදීම, රෙගුලාසි සම්පාදනය කිරීම හා ගැසට් කිරීම, හෝමියෝපති ඖෂධ

නිෂ්පාදනය පිළිබඳ වෙළඳපොල සුලභතාවය තහවුරු කිරීම සඳහා අතුරු නීති සම්පාදනය කිරීම, හෝමියෝපති බෙහෙත් ගබඩා සහ ඔසුසල් පිහිටුවීම සඳහා අරමුදල් ගොඩනැගීම හා ඖෂධ තොග ආනයනය සහ බෙදාහැරීමට සැළසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ඒ සම්බන්ධයෙන්වූ කිසිදු ක්‍රියාකාරකමක් සිදු කර නොතිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කිරීම සඳහා 2008 වර්ෂයේදී ගොඩනැගිල්ලක් ඉදිකර 2009 වර්ෂයේදී ලී බඩු හා උපකරණ සපයාගෙන තිබුණද, එහි අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට අදාළ නීතිමය රාමුව පිළියෙල කිරීමට පියවර ගෙන නොතිබීම නිසා 2016 නොවැම්බර් 01 දින වන විටත් අධ්‍යයන කටයුතු ආරම්භකර නොතිබුණි. ඒ අනුව මිලදී ගෙන තිබුණු පිරිවැය රු.1,199,254 ක් වූ ස්ථාවර වත්කම් හා ඊට අදාළ ගොඩනැගිල්ල වසර 05 ට අධික කාලයක් තිස්සේ නිෂ්කාර්යව පැවතුණි.

(ආ) 2012 ජනවාරි 05 දින පැවති අතුරු පාලක කමිටු රැස්වීමේදි වෛද්‍ය සායන 7 සඳහා පොදු නියෝග මාලාවක් සැකසීමටද, 2013 අගෝස්තු 29 දින පැවති අතුරු පාලක කමිටු රැස්වීමේදී නව සායන 14 ක් සඳහා තනතුරු අනුමත කරවා ගැනීමට හා හෝමියෝපති අධ්‍යාපන ආයතනය පිළිබඳ රීතින් හා අවශ්‍යතා ගැසට් කිරීමටද, 2014 ජනවාරි 08 දින පැවති අතුරු කමිටු රැස්වීමේදි හෝමියෝපති ඖෂධ නිෂ්පාදනය, ආනයනය හා බෙදාහැරීම පිළිබඳව 1981 හෝමියෝපති නියෝග තවදුරටත් පුළුල් කරමින් ප්‍රමාණවත් පරිදි නීති හා රෙගුලාසි සකස් කිරීමටද තීරණය කර තිබුණු නමුත් විගණිත දිනයවූ 2016 ජූලි 04 දින වනවිටත් එම තීරණ ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) වාර්ෂික ලියාපදිංචිය අලුත් කිරීම සඳහා මුදල් ගෙවා නොමැති වෛද්‍යවරු හඳුනාගෙන මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.3 ආර්ථික නොවන ගනුදෙනු**

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පවත්වාගෙන යනු ලබන සායන 7 න් වාර්ෂිකව ප්‍රතිකාර ගනු ලබන රෝගීන්ගේ සාමාන්‍යය 55,000 ක් පමණ වන අතර ඔවුන් සඳහා වාර්ෂික සාමාන්‍ය පරිභෝජනය ඩප්පි 220,000 ක් වුවත්, සමාලෝචිත වර්ෂය තුළදී රු.1,145,241 ක් වැය කර ඖෂධ බහාලුම් (ඩප්පි) කුඩා හා විශාල ප්‍රමාණයේ ඒකක 1,764,000 ක් මිලදී ගෙන තිබුණි. වෛද්‍ය සභාව සතුව ප්‍රමාණවත් හා ප්‍රමිතියෙන් යුත් ගබඩා පහසුකම් නොතිබියදී වර්ෂ 8 කට වැඩි කාලයකට ප්‍රමාණවත් තොගයක් මිලදී ගැනීම සඳහා විශාල මුදලක් වැය කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරුන් වෙත අළෙවි කිරීමේ අපේක්ෂාවෙන් රු.62,000 ක් වැය කර වෛද්‍ය සහතික පොත් 500 ක් මිලදී ගෙන තිබූ නමුත් 2016 ජූලි වන විටත් පොත් 13 ක් පමණක් අළෙවි කර තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

----------------------------------------

### 5.1 අභ්‍යන්තර විගණනය

----------------------

හෝමියෝපති වෛද්‍ය සභාව තුළ අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මක නොවන අතර සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් විගණන කටයුතු සිදු කර නොතිබුණි.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

-----------------------------

වෛද්‍ය සභාව සතුව වාහනයක් නොතිබියදී වාහන නඩත්තු වියදම් වෙනුවෙන් රු.500,000 ක් සහ ඉන්ධන  වෙනුවෙන් රු.180,000 ක් අයවැය මගින් වෙන්කර තිබූ අතර අයවැය ඇස්තමේන්තුවේ ප්‍රතිපාදන සළසා නොතිබුණු විෂයයන් 11 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.1,974,774 ක් වැයකර තිබුණි. තවද අයවැය ලේඛනයට අනුව වියදම් අයිතම 13 ක ඇස්තමේන්තුගත වියදම හා සත්‍ය වියදම අතර සියයට 50 සිට සියයට 100 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 5.3 නොවිසඳී ඇති විගණන ඡේද

-----------------------------

වර්තමාන තත්ත්වයට ගැලපෙන පරිදි හෝමියෝපති  වෛද්‍ය සභාවේ රෙගුලාසි යාවත්කාලීන කළයුතු බවට 2010 සැප්තැම්බර් 15 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව නියෝග කර තිබුණු නමුත්, සමාලෝචිත වර්ෂය අවසාන වනවිටද හෝමියෝපති වෛද්‍ය සභාව පත්කර නොතිබීම හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දින වන විටත් එම නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී.  මූලික උපයෝගී පොත් හා ලෙජර් ගිණුම් සහිතව ගිණුම් කටයුතු පවත්වා ගෙන යාම කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.